වාර්ෂික වාර්තාව 2021

සම්පාදනය:
ශ්‍රම වාසනා අරමුදල

ප්‍රකාශනය:
ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රකාශන කමිටුව

සියලුම හිමිකම් ඇවිරිණි
2021

පටුන ... පිටුව

✓ ආයතනික තොරතුරු

1. ශ්‍රම වාසනා අරමුදල හා එහි අරමුණු. 03
2. මෙහෙවර හා දැක්ම 04
3. මූලික අගයන් සහ චර්යාධර්ම 04
4. ඉදිරි අභියෝග සහ වගකීම් 05
5. පාලන ව්‍යුහය 06
6. සංවිධාන සටහන 07
7. අනු කමිටු 08 - 09
8. අරමුදලේ වර්ධනය හා ලොතරැයි ආදායම 10
9. මූල්‍ය කාර්යසාධන සමාලෝචනය 11 - 12
10. 1998 - 2021 විශේෂ අවස්ථා 13 - 15
11. අරමුදලේ කාර්යසාධනය 2021 16 - 20

✓ මූල්‍යමය තොරතුරු

1. මූල්‍ය තත්ව ප්‍රකාශය 21
2. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 22
3. හිමිකම් වෙනස්වෙමේ ප්‍රකාශය 22
4. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 23
5. ගිණුම්කරණ ප්‍රතිපත්තිය 24 - 28
6. ගිණුම්වලට අදාල සටහන් 29 – 33
7. විගණකාධිපති වාර්තාව 34 – 41
8. අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය 42 – 44

✓ ඇමුණුම 45

ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6 ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලට අරමුදල් සැපයෙන ප්‍රධාන ප්‍රවාහය වන්නේ බ්‍රහස්පතින්දා හා සෙනසුරාදා යන දිනවල ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන ආදායමයි. මීට අමතරව ශ්‍රම වසනා අරමුදල සතු ස්ථාවර තැන්පතු ආයෝජන වලින් ලැබෙන පොලි සහ කෙටිකාලින ආයෝජන වලින් ලැබෙන පොලි මුදල් ද අරමුදලේ අරමුදල් ලෙස ගැනේ, මෙම අරමුදල්. ලොතරැයි පත් අලෙවිය අනුව තීරණය වන අතර, අරමුදලේ ආදායම් තත්වය අනුව සිදුකරනු ලබන වැඩසටහන් වසරින් වසර වර්ධනය වීම සිදුවේ.

අරමුදලේ අරමුණු

1) සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.
2) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.
3) හදිසි අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.
4) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.
5) ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.
6) සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

   කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.

දැක්ම හා මෙහෙවර

දැක්ම

“තෘප්තිමත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්”

මෙහෙවර

“කම්කරු ප්‍රජාවට සුභසාධනය සැපයීම හා විපතකදී පිහිටවීම සඳහා පවතින යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු පුරවමින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම”

මූලික අගයන් සහ චර්යාධර්ම.

- ✓ ශ්‍රම වාසනා අරමුදලින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සඳහා කාර්යක්ෂම වූ සේවාවක් සැපයීම සඳහා වන සදාචාරාත්මක බැඳීම තහවුරු කිරීම.
- ✓ සේවලභින් සඳහා සේවා සැපයීමේ දී ශ්‍රම වාසනා අරමුදලේ නීති රෙගුලාසි හා ක්‍රම වේදයන්ට යටත්ව ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීම.
- ✓ ශ්‍රම වාසනා අරමුදල මගින් සිදුකරනු ලබන සේවාවන් පිළිබඳව සේවාලාභීන් තුළ වඩා දැනුවත් භාවයක් ඇති කිරීම.

ඉදිරි අභියෝග හා සාමාජීය වගකීම්.

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආධායම් ප්‍රභවය වන සෙනසුරාදා හා බ්‍රහස්පතින්දා දිනුම් අදින "ජාතික සම්පත" ලොතරැයිය හා තරඟකාරීව තවත් ලොතරැයි ක්‍රියාත්මක වීමත්, එවැනි විවිධ ලොතරැයි තුලින් පිරිනමන ප්‍රථම ත්‍යාග මුදලේ වටිනාකම ඉතා ඉහළ අගයක් ගැනීම වැනි හේතුවෙන් එවැනි ලොතරැයි වලට සාපේක්ෂව 'ජාතික සම්පත" ලොතරැයි ටිකට් පත් අලෙවිය අඩු මට්ටමක පවතී. මෙම තත්වය අරමුදලේ වර්ධනයට අහිතකර ලෙස බලපාන බැවින් ලොතරැයි අලෙවිය වැඩි කර ගැනීම සඳහා ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩි කිරීමට තීරණය කර ඇත. එසේම පාරිභෝගිකයන්ට ටිකට් පත් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමට හැකිවන පරිදි පහසු ක්‍රම වේදයන් සැලසුම් කිරීම පිළිබඳව ද සාකච්චා කරමින් පවතී. ඉදිරියේදී ලොතරැයි ආධායම මත ම පදනම් නොවී විදේශීය ආධාර හා ප්‍රධානයන් ලබා ගැනීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත 2019 අංක 15 ලෙස සංශෝධනය සිදු කල අතර ඒ නිසා වැඩසටහන් සැලසුම් කිරීමේ දී තිබූ ගැටලුකාරී තත්වයන් අවම කර ගැනීමට හැකිවූ අතර ම විශේෂයෙන් සේවානියුක්තයන්ගේ යැපෙන්නන් ද ප්‍රතිලාභීන් ලෙස සලකා අරමුදලේ ප්‍රතිලාභ සේවා නියුක්තයන්ගේ පවුල් ආවරණය වන ලෙස ලබා දීමේ හැකියාව ඇති විය. එසේම ජාතික ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී හා කම්කරු කොමසාරිස් ජනරාල් නිල බලයෙන් අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම මත ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණ කටයුතු සිදුකිරීමට පහසු වූ අතර දිවයින තුල ඇති කම්කරු කාර්යාල වල සහයෝගය හා කම්කරු නිලධාරීන්ගේ සහයෝගය අරමුදලේ කටයුතු වෙනුවෙන් ලබාගැනීම පහසු විය.

සමාජීය හා පාරිසරික වගකීම්.

කර්මාන්තශාලා/ආයතන තුළ සිදුවන ව්‍යැත්තීය අනතුරු හේතුවෙන් අසරණ වන හෝ මරණයට පත්වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් හට ශිෂ්‍යත්ව ලබාදීම සිදුකරන අතරම මෙවැනි අනතුරු පිළිබඳව පුර්ව අවධානය යොමුකොට ඒවා වලක්වා ගැනීම සඳහා අවධානම් සහිත කර්මාන්තශාලා හදුනාගෙන ව්‍යැත්තීය අනතුරු අවම කරගැනීම පිලිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දීප ව්‍යාප්තව සිදු කරයි. මෙම හේතුව නිසා ම පසු ගිය අවුරුදු කිහිපය තුල කාර්මික අනතුරු වල යම් අඩුවක් හා කාර්මික මරණ ප්‍රමාණයේ අඩු වීමක් සිදුවී ඇති බවත්, ආයතන තුල අනතුරු අවම කරගැනීම පිලිබඳ සංස්කෘතියක් වර්ධනය වීමත් වාර්තා වී ඇත.

පාලන ව්‍යුහය.

1998 අංක 12 (2019 අංක 07 දරණ සංශෝධිත) දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අතර අරමුදලෙහි සභාපතිත්වය අරමුදල අයත් රේකීය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ. ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමනාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කරනු ඇත.

2021 වසරේ ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය.

නම	තනතුර
එම්.පි.ඩි.යු.කේ. මාපා පතිරණ මහතා	සභාපති
බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා	සාමාජික
බී.සී.බී. තිලකරත්න මිය	සාමාජික
වයි.කේ. ශිරෝමි ජීවමාලා මිය	සාමාජික
ලලිත් කන්නන්ගර මහතා	සාමාජික
සුදන්ත බණ්ඩාර මහතා	සාමාජික
පී.ඩී.එම්.එස්. ගමගේ මහතා	සාමාජික
බී.ආර්.සී. ගුණවර්ධන මහතා	සාමාජික

කාර්ය මණ්ඩල සංයුතිය -2021-12-31

ජ්‍යෙෂ්ඨ මට්ටම		තෘතීය මට්ටම		ද්විතීය මට්ටම		ප්‍රාථමික මට්ටම		එකතුව		
අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	හිඟස්ථාඩු
01	01	04	03	08	08	04	04	17	16	01


සංවිධාන සටහන
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අභ්‍යන්තර විගණන නිලධාරී
සාමාන්‍යාධිකාරී
ගණකාධිකාරී
කළමණාකරු
සහකාර කළමණාකරු
කළමණාකරණ සහකාර (තාක්ෂණික)
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර
කළමණාකරණ සහකාර
රියදුරු
රියදුරු
කාර්යාල සහායක
කාර්යාල සහායක

ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාපනය කර ඇති අනු කමිටු.

1. අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව,
2. ප්‍රතිලාභ කමිටුව,
3. ප්‍රගති සමාලෝචන කමිටුව,

අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව.

ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව ස්වාදීනව ක්‍රියාකරන අංශයක්වේ. මෙම කමිටුවේ මූලික අරමුණ වන්නේ ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්මේ නිර්ණායක / නිර්දේශ පදනම් කර ගනිමින් අරමුදලේ ආයතනික පාලනය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම ආදී කාර්යන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමයි.

ගිණුම් කටයුතු මෙහෙයවීමේ දී මුල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා හා අඩුපාඩු වලක්වා ගැනීම, වත්කම් ආරක්ෂා කිරීම වැනි කාර්යන්වලට බලපාන නීති රීති අනුකූලතාවය අරාක්ෂා කරගැනීම පිළිබඳ විමසිලිමත් වීමයි.

අභ්‍යන්තර විගණන කමිටුවේ ප්‍රධානියා/සභාපති, සෘජුවම අරමුදලේ සභාපති වෙත වාර්තා කරණ අතර මෙම විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2021 වසරේ විගණන කමිටුව පහත සාමාජිකයින් ගෙන් සමන්විත වේ.

1. බී.සී.බී. තිලකරත්න මිය,	භාණ්ඩාගාර නියෝජිත/කමිටු සභාපති
2. සුසන්ත බණ්ඩාර මයා.	කමිටු සාමාජික,
3. ලලිත් කන්නන්ගර මයා	කමිටු සාමාජික,

විගණන හා කළමනාකරණ කමිටුවේ මූලික කාර්යයන්

1. ශ්‍රම වාසනා අරමුදලේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම

2. අරමුදලේ පූර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැගී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ශනය කිරීම.

3. වත්කම් අලාභ හානීන් සහ වංචා වලින් ආරක්ෂිතව තිබේ දැයි විශේෂිතව දැන ගැනීම

4 ගණුදෙනුවල අවශ්‍යතාවය හා ගණුදෙනුවල වල ප්‍රතිලාභ විමර්ශනය කිරීම, නාස්තිය සහ අසාමාන්‍ය ලෙස වැඩිපුර වියදම් කිරීම, වත්කම් ඉවත් කිරීම තුළින් සිදුවන ලාභ පාඩු සහ වියදම් අඩු කිරීම් වාර්තා පිළිබඳව විමර්ශනය කිරීම.

5. විගණන කමිටු රැස්වීමට පියවර ගැනීම හා විගණන තීරණ සැකසීම අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අංශ ප්‍රධානීන් අතර ඒවා බෙදාහැරීම.

6. විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

7. අරමුදලේ සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන පැවැත්වීම.

8. අරමුදලේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලබන විවිධ කමිටු වලට සහයවීම හා නිර්දේශ ලබාදීම.

ප්‍රතිලාභ කමිටුව.

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණුවලට අනුව සිදුකරන ශිෂ්‍යත්ව ලබාදීම, වෛද්‍යාධාර ලබාදීම, නීති ආධාර ලබාදීම යන වැඩසටහන් වලට අදාල ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම ඒ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක පදනම් කර ගනිමින් ප්‍රතිලාභ කමිටුවක් හරහා සිදු කරයි. මෙම ප්‍රතිලාභ කමිටුව අරමුදලේ සාමාන්‍යාධිකාරී, රේකීය අමාත්‍යාංශයේ නීති අංශයේ නිලධාරී වරයෙකු, වෘත්තීය රෝග විශේෂඥ වෛද්‍ය වරයකු යන අයගෙන් සමන්විත වේ. නිවැරදි ක්‍රමවේදයකට අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට මෙම කමිටුව උපකාරී වේ.

ප්‍රගති සමාලෝචන කමිටුව.

විගණනය විසින් වරින් වර දෙන ලද උපදෙස් අනුව ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිහිටුවන ලද කමිටුවකි. ශ්‍රම වාසනා අරමුදලේ දෛනිකව සිදුවන කටයුතු සොයාබැලීම ප්‍රධාන කාර්යය වේ. මෙම කමිටුව අරමුදලේ කළමනාකරු, ගණකාධිකාරී සහ සහකාර කළමනාකරු යන තිදෙනාගෙන් සමන්විත වන අතර, විශේෂයෙන් එදිනෙදා සිදුකරන කටයුතු, නිම කරන ලද ලිපිගොනු සකස්කිරීම, සැලසුම් කරන ලද වැඩ හා සත්‍ය ලෙස සිදු වී ඇති තත්වයන් පිලිබඳ සොයාබලා වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම කමිටුව විසින් සිදු කරයි. අරමුදලේ ලිපිගොනු අඩුපාඩුවලින් තොරව පවත්වා ගෙන යාමට හා වැඩසටහන් ක්‍රමවත්ව සිදුකිරීමට මෙම කමිටුව පිටිවහලක් වී ඇත.

ශ්‍රම වසනා අරමුදලේ වර්ධනය හා ලොතරැයි ආදායම

ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය (රුපියල් මිලියන)



අරමුදලේ වටිනාකම (රු.මිලියන)



ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා කලින් කළ සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

(ඇ) අරමුදල මඟින් කරන ආයෝජනවලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුළුව මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී අරමුදලට ලැබෙන සියලුම මුදල්

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයන් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමඟින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුල ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමඟ එම සීමාවලින් ඔබ්බට තව දුරටත්සේවාවන් පුළුල් කිරීම වසරින් වසර සිදු කරමින් පවතී.

මූල්‍ය කාර්යසාධන සමාලෝචනය

ආදායම (රුපියල්) .



වියදම (රුපියල් මිලියන)



.

මුළු වත්කම් සංයුතිය (රුපියල්)



මුළු වත්කම් හා වගකීම් (රුපියල්)



ශ්‍රම වාසනා අරමුදලේ 1998 – 2021 විශේෂ අවස්ථා.

1998 මාර්තු 31 වන දින ශ්‍රම වසනා අරමුදල ආරම්භ කළ අතර සාමාන්‍යාධිකාරී හා කාර්යය මණ්ඩලයේ තිදෙනෙකු ගෙන් සැදුම් ලත් ඉතා අඩු කාර්යය මණ්ඩලයක් මගින් සියලු කටයුතු කරගෙන යන ලදී. මෙසේ 2010 වසර පමණ වන තෙක් ඉතාම අඩු පහසුකම් මත බොහෝ දුෂ්කරතා මධ්‍යයේ අරමුදලේ කටයුතු සිදුකරන ලදී.

2010 වසරේ සිට අරමුදලේ සේවාවන් පෙරට වඩා මුළු දිවයිනම ආවරණය වන ලෙස පවත්වාගෙන යාම අරමුණු කර නව කාර්යය මණ්ඩලය බඳවා ගැනීම, අරමුදලට අවශ්‍ය සම්පත් මිලදී ගැනීම, සේවක පුහුණුව හා සංවර්ධන වැඩසටහන් පවත්වා ඔවුන් යාවත්කාලීන කිරීම නිරන්තර ව සිදු කරන ලදී, මුලින් තිබූ ‘‘ශ්‍රම වාසනා ක්ෂණික’’ ලොතරැයිය ‘‘ජාතික සම්පත-සෙනසුරාදා’’ ලෙස දිනුම් අදිනු ලබන ලොතරැයියක් ලෙස වෙනස් කිරීම හා ලොතරැයි ප්‍රවර්ධන කටයුතු පුළුල් කිරීම තුලින් ලොතරැයි අලෙවිය වැඩිවීම මත අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ ප්‍රතිශතය ඉහළ යන ලදී.

අරමුදල හා එහි කාර්යයන් ප්‍රතිලාභීන් අතරට රැගෙන යාම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා කම්කරු ඉංජිනේරු කාර්යාල හා එක්ව කටයුතු කල අතර, අරමුදලේ කාර්යන් ඇතුළත් පෝස්ටර් ලංකාවේ සියලුම කම්කරු විනිශ්චය සභා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කරන ලද අතර මේ තුළින් අරමුදල පිලිබඳ ජනතාව දැනුවත් වූ අතර එය ලොතරැයි අලෙවිය වැඩිවීමට ද හේතු විය.

අරමුදලේ අරමුණුවලට අනුව කටයුතු සිදුකරන අතර වඩාත් ඵලදායි ලෙස සේවා සැපයීම අරමුණු කර අමාත්‍යාංශය යටතේ පැවති ආයතන අතුරින් ආයතනයක් හිමිකරගත් පළමු ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය 2016 වසරේ ශ්‍රම වාසනා අරමුදල හිමි කරගන්නා ලදී.

ආයතනික කටයුතු පුළුල් කරමින් බොහෝ කාර්යයන් පහසුවෙන් හා කඩිනමින් සිදුකර ගැනීම සඳහා පරිගණක ගත ක්‍රමවේද අනුගමනය කරමින් මාර්ග ගත (Online System) ක්‍රමයට නිලධාරීන්ට තම රාජකාරී සිදු කිරීමටත්, ප්‍රතිලාභීන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් අවශ්‍ය පරිගණක ගත වැඩ පරිසරයක් (Computer Base Working Environment) ශ්‍රම වාසනා අරමුදල තුළ ස්ථාපනය කර ඇත. එසේම Digital Recording System භාවිතා කරමින් ඉතා කඩිනමින් ප්‍රතිලාභීන්ට තොරතුරු ලබාදීමද දැනටමත් සිදු කරයි. ඉදිරි වසර තුළ ජාතික ඵලදායිතා තරගාවලියට ඉදිරිපත් වීමට සහ 5-S සංකල්පය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ තුළින් අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායිව සිදුකිරීම අරමුණ වේ.


SVF Digital Records System
All the statistics are below genereated for the current year--2021
Legal 31
Actions Completed Legal Aids 0
Sucessfully Completed Legal Aids 0
Rejected Legal Aids 0
Closed Legal Aids 0
Click here to Register Express Legal Aid Registration
More Info
Medical 0
Actions Completed Medical Aids 0
Approved Medical Aids 0
Rejected Medical Aids 0
Closed Medical Aids 0
Click here to Register Express Medical Aid Registration
More Info
Scholarships 26
Actions Completed Scholarships 56
Approved Scholarships 53
Rejected Scholarships 3
Closed Scholarships 0
Express Scholarship Registration
More Info
Health Camps 0
Click Here to Register Health Camp Participants
Empowerment Programs 0
Click Here to Register Empowerment Program Participants
Awareness Programs 6
Click Here to Register Awareness Program Participants
300
200
100
0
2015
2016
2017
2018
2019
2020
2021
Legal Aids
Medical Aids
Scholarships
Legal Aid More Graphs
Medical Aid More Graphs
Scholarship More Graphs

ශ්‍රම වාසනා අරමුදල අත්පත් කරගත් ජයග්‍රහණ

ශ්‍රම වාසනා අරමුදල ISO තත්ව සහතිකය ලබා ගැනීම



TÜV NORD

CERTIFICATE

Management system as per
ISO 9001 : 2015

SHRAMA VASANA FUND
Ministry of Foreign Relations,
Skills Development & Employment and Labour Relations,
07, Jawatta, Colombo - 00500,
Sri Lanka

Provision of Resources for the Welfare of Sri Lankan Labour Force and their related Parties

රූපසටහන - 01

හොඳම වාර්ෂික වාර්තා සහ හිණුම් 2019 තරගයේ තෙවන ස්ථානය ලබා ගැනීම



CA

APFA

Best Annual Reports and Accounts Awards for Public Sector - 2019

Public Sector - Statutory Boards Category

BRONZE AWARD

AWARDED TO

Srama Wasana Fund

On 29th December 2021 in Colombo

By The
Association of Public Finance Accountants of Sri Lanka (APFASL), the Public Sector Wing of CA Sri Lanka

V. Kanagasabapathy
PRESIDENT, APFASL

Asela Athajuthu
SECRETARY APFASL

ASSOCIATION OF PUBLIC FINANCE ACCOUNTANTS OF SRI LANKA

රූපසටහන - 02

ශ්‍රම වාසනා අරමුදලේ කාර්යසාධනය 2021.

2020 වසර ආරම්භයත් සමග ලෝකයට බලපාන ලද කොවිඩ් 19 වසංගතයේ බලපෑම ශ්‍රී ලංකාවට ද බලපෑම් එල්ල කළේය. මෙම වසංගත තත්වය හමුවේ 2021 වසර වෙනුවෙන් ශ්‍රම වාසනා අරමුදල සැලසුම් කරන ලද කාර්ය සාදනය අපේක්ෂිත මට්ටමින් ඉටු කර ගැනීමට නොහැකි විය.

විශේෂයෙන් රටතුල සංචරණ සීමා පැනවීම, යම් යම් ප්‍රදේශ තාවකාලිකව වසා දැමීම, සේවා වාර ක්‍රමයන් ට අනුගත වෙමින් අත්‍යවශ්‍ය රාජකාරි පමණක් සිදු කිරීම වැනි හේතු මෙයට බලපාන ලදී.

තවද ශ්‍රම වසනා අරමුදලේ බොහෝ වැඩසටහන් ආයතනයෙන් බැහැර කර්මාන්තශාලා, වැඩබිම්, ඉලක්කකර එම පරිශ්‍රයන් වෙත ගොස් සිදුකරන පසුබිමක සංචරණ සීමා හා එම ආයතනවල ආරක්ෂාව වැනි හේතූන් නිසා අපගේ වැඩසටහන් වෙනුවෙන් ප්‍රයෝගිකව සේවක සේවිකාවන් යොමු කරවා ගැනීමේ ගැටළු වැනි හේතූන් නිසා 2021 වර්ෂයේ කාර්ය සාදනය අපේක්ෂිත මට්ටමින් ඉටු කිරීමට නොහැකි විය.

එසේම ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වන ලොතරැයි පත් අලෙවිය අඩුවීම හේතුවෙන් වාර්ෂිකව ලැබෙන ආදායම සීඝ්‍රයෙන් පහත වැටුණි. මේ නිසා 2021 වසරට සැලසුම් කරන ලද වැඩසටහන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි සංශෝධනය කර සිදු කිරීමට තීරණය කරන ලදී.

මෙවැනි තත්වයන් මධ්‍යයේ 2021 වසර තුල මේ දක්වා ශ්‍රම වාසනා අරමුදල විසින් සිදුකරන ලද වැඩසටහන් පහත දක්වා ඇත.

01. දැනුවත් කිරීමේ වැඩසටහන්.

දළ විශ්ලේෂණය.

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ අතර සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරු වලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුලින් සිදු වී ඇති බව පැහැදිලි විය.

මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසර වල අනතුරු වාර්ථා වී ඇති හා අවධානම් තත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිදුකරන ලදී.

එසේම කම්කරු නීති අණපණත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටලුකාරී තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රෙය් පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදි.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර කම්කරු නීති අනපණත් පිළිබඳ සේවක සේවිකාවන් හා සේවය ප්‍රජාව දැනුවත් වූ අතර වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් කාර්මික අනතුරු අවම කිරීමටත් හැකියාව ඇති විය.



සිතියම - 01













ඡායාරූප: ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ දැනුවත්කිරීමේ වැඩසටහන් අවස්ථාවන්

02. මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන.

දළ විශ්ලේෂණය.

ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලාවල සිදුවන අනතුරුවලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කර ගෙන ප්‍රතිලාභීන් හඳුනා ගන්නා අතර මියගිය හෝ පූර්ණ බෙලහීන තත්ත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල හෝ උසස් අධ්‍යාපනය දක්වා එනම්, වයස 3-25) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, එවැනි දරුවන් වෙනුවෙන් රු.50,000/= ස්ථාවර තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දීම කරනු ලබයි.

2021 වසරේ මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ තෝරාගත් සිසු දරු දැරියන් 95 දෙනෙකු වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දුන් අතර, පැවති වසංගත තත්වය මත එය කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දඹුල්ල කම්කරු කාර්යාලය, හා අනුරාධපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාල යන ස්ථානවල දී සිදු කරන ලදී.



සිතියම - 02













ඡායාරූප: ශ්‍රම වාසනා අරමුදල විසින් පවත්වනු ලැබූ මරණීය අනතුරු ඖෂ්‍යත්ව වැඩසටහන් අවස්ථාවන්

3 සුබසාදක වැඩසටහන්

දල විශ්ලේෂණය,

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන අරමුණක් ලෙස සුබ සාධන වැඩසටහන් හඳුන්වා දිය හැක. බොහෝ සේවක පිරිසක් උදෙසා ප්‍රතිලාභයන් ලැබෙන පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර සේවා නියුක්තයන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් ඉලක්ක කර ගනිමින් විවිධ වැඩසටහන් සංවිධානය කරයි. විශේෂයෙන් ම අඩු ආදායම්ලාභී කම්කරු පවුල් මේ සඳහා තෝරාගනු ලැබේ. මීට පෙර වසර කිහිපයක්ම ආයෝජන ප්‍රවර්ධන කලාප ඉලක්ක කර අත් පන්දු ක්‍රීඩා පිටි සැකසීම්, දන්ත ශල්‍යාගාර ඉදිකිරීම් සිදු කරන ලදී. මෙහි දී සේවකයන් අතර අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීම ප්‍රධාන අරමුණ වී තිබුණි.

2021 වසරේ මාර්තු මාසයේ දඹුල්ල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී කම්කරු පවුල් වල දූ දරුවන් උදෙසා පාසල් උපකරණ ලබා දෙමින් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කර ගැනීමට අධ්‍යාපනයෙන් සහය දීම අපේක්ෂා කරන ලදි.

එසේම බදුල්ල දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී සේවකයන් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සනීපාරක්ෂාව ඉහළ නැංවීම උදෙසා වැසිකිළි පහසුකම් ඇති කිරීමට වැසිකිළි ව්‍යාපෘතියක් නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී.







මූල්‍යමය තොරතුරු

ශ්‍රම වාසනා අරමුදල 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය			
වත්කම්		(රුපියල්)	(රුපියල්)
ජංගම වත්කම්		**2021**	**2020**
මුදල් හා මුදල් සමාන වත්කම්	සටහන 03	2,104,692	2,104,692
තොගය	සටහන 05	1,495,145	1,495,145
ස්ථාවර තැම්පතු		13,000,000	113,000,000
කෙටි කාලීන තැම්පතු		4,000,000	-
ලැබිය යුතු අයිතම	සටහන 04	351,639,626	336,338,916
		426,904,164	**452,938,752**
ජංගම නොවන වත්කම්			
වෙබ් පාදක පද්ධති ආයෝජන		-	2,774,958
ස්ථාවර තැම්පතු		30,000,000	-
අස්පෘශ්‍ය වත්කම්	සටහන 02	2,236,817	22,850
පිරියත, යන්ත්‍ර හා උපකරණ	සටහන 01	11,053,104	12,312,818
		43,289,920	15,110,626
මුළු වත්කම්		**470,194,085**	**468,049,378**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු බිල්පත්	සටහන 07	73,855	159,413
වෙන් කිරීම්	සටහන 08	1,247,000	1,239,500
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		1,902,262	1,332,567
මුළු වගකීම්		3,223,117	2,731,479
ශුද්ධ වත්කම්		**466,970,968**	**465,317,899**
සමුච්ත අතිරික්තය	සටහන 06	463,707,968	461,692,399
සංචිත			
රාජ්‍ය ප්‍රදාන		3,263,000	3,625,500
මුළු වත්කම්		**466,970,968**	**465,317,899**

මෙම මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් වලට අදාල සටහන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

සභාපති එම්.පී.ඩී.යූ.කේ.මාපා පතිරණ ශ්‍රම වසනා අරමුදල.	අධ්‍යක්ෂ ඩී.කේ.පී. චන්ද්‍රකීර්ති ශ්‍රම වසනා අරමුදල.	සාමාන්‍යාධිකාරී ඩී.ආර්.ජයලත් ශ්‍රම වසනා අරමුදල.	ගණකාධිකාරී එම්.එල්.ජයමාලි ශ්‍රම වසනා අරමු

ශ්‍රම වාසනා අරමුදල 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්තාව			
ආදායම්		(රුපියල්) **2021**	(රුපියල්) **2020**
ආදායම්	සටහන 10	34,672,316	37,802,625
මුළු ආදායම්		34,672,316	37,802,625
වියදම්			
පරිපාලන වියදම්	සටහන 11	14,791,283	14,731,837
ක්ෂය	සටහන 12	3,006,226	2,054,339
අරමුණු ගත වියදම්	සටහන 13	14,445,075	8,131,554
වෙනත් වියදම්	සටහන 14	288,897	554,378
		32,531,481	25,472,108
වසරේ අතිරික්තය		**2,140,835**	**12,330,517**

ශ්‍රම වාසනා අරමුදල 2021 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය		
	(රුපියල්)	(රුපියල්)
2019.12.31 දිනට ශේෂය	449,370,824	449,370,824
පසුගිය වසරේ ගැලපීම්	(8,942)	(8,942)
වසරේ අතිරික්තය	12,330,517	12,330,517
2020.12.31 දිනට ශේෂය	461,692,399	461,692,399
පසුගිය වසරේ ගැලපීම්	(125,266)	(125,266)
වසරේ අතිරික්තය	2,140,835	2,140,835
2021.12.31 දිනට ශේෂය	**463,707,968**	**463,707,968**

ශ්‍රම වාසනා අරමුදල
2021-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ලැබීම්		(රුපියල්) **2021**	(රුපියල්) **2020**
වසරේ අතිරික්තය		2,140,835.12	12,330,516.67
මුදල් නොවන වලනයන්			
ක්ෂය		2,445,234.39	2,048,339.30
ක්‍රමක්ෂය		560,991.60	6,000.00
රාජ්‍ය ප්‍රධාන ක්‍රමක්ෂය		(362,500.00)	-
වත්කම් විකිණීමෙන් ලැබූ ලාභ		(4,965.57)	
ආයෝජන ආදායම්		(6,311,136.97)	(7,600,124.14)
ආපදාණය පොලී		(68,932.57)	(44,120.73)
(Repo) කෙටිකාලීන පොලී		(295,650.37)	(23,200.00)
(Call Deposit) ඇමතුම් තැම්පතු පොලී		(22,006.85)	-
වෙනත් ආදායම්		(109,165.57)	(100,780.00)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
ගෙවියයුතු වෙනත් දෑ		(85,557.78)	27,368.31
වෙන්කිරීම්		577,195.00	622,962.50
ලැබියයුතු වෙනත් දෑ		(14,629,658.00)	(357,266.00)
තොග වෙනස්වීම්		(908,489.81)	(636,592.38)
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ගලා ඒම		**(15,256,827.76)**	**6,273,103.53**
ආයෝජන කටයුතුවලින් මුදල් ගලා ඒම			
දේපල යන්ත්‍ර උපකරණ මිලට ගැනීම		(1,195,605.00)	(1,276,513.40)
ආයෝජන ආදායම්		5,514,818.48	11,097,424.30
ආපදාණය පොලී		68,932.57	44,120.73
(Repo) කෙටිකාලීන පොලී		295,650.37	23,200.00
(Call Deposit) ඇමතුම් තැම්පතු පොලී		22,006.85	-
වෙනත් ආදායම්		109,165.57	100,780.00
දේපල යන්ත්‍ර උපකරණ විකිණීමෙන් ලැබීම්		15,050.00	39,755.00
ස්ථාවර තැම්පතු පොළී		(13,000,000.00)	(18,000,000.00)
(Repo) කෙටිකාලීන ආයෝජන		(4,000,000.00)	-
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම		**13,830,018.84**	**(7,971,233.37)**
ශුද්ධ වැඩිවීම්/ අඩුවීම් මුදල් හා මුදල් සමාන අයිතම		(1,426,808.92)	(1,698,129.24)
වසරේ ආරම්භක මුදල් හා මුදල් සමාන අයිතම		2,104,691.77	3,802,821.01
වසර අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතම		**677,882.85**	**2,104,691.77**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය.

1.පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1.1 වාර්තා කරණ ඒකකය.

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් (සංශෝධන) පනත මගින් සංස්ථාගත කර ඇත.

1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය.

2021 ජනවාරි මස 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය.

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය කාලපරිච්ඡේදය 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් මස 31 වන දින දක්වා මාස 12 ක කාලපරිච්ඡේදය නියෝජනය කරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශ වලට සටහන් ඇතුලත් වේ. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS'S) අනුකූල ව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

1.4.2 මිනුම් කිරීමේ පදනම

වත්කම් නැවත ඇගයීම සඳහා ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම ගිණුම් වලට බලපාන උද්ධමනකාරී සාධකයන් ගණනය කොට නැත.

1.4.3 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලතාවය දැක්වීම සඳහා ප්‍රමාණාත්මක ,විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හා සැසඳිය හැකි වන පරිදි මූල්‍ය ප්‍රකාශ තුලින් වාර්තා කර ඇති සියලුම වටිනාකම් පෙර වර්ෂ වලට අනුව හෙලිදරව් කිරීම් කර ඇත.

අවශ්‍ය අවස්ථාවලදී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීමට සංසන්දනාත්මක සංඛ්‍යා සංශෝධනය කර ඇත.

1.4.4 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රම වාසනා අරමුදලේ ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වටිනාකමෙන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.4.5 ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී විනිශ්චයන් ,තීන්දු තීරණ හා උපකල්පන භාවිතයට ගැනීම අවශ්‍යය වන අතර ඒවායේ ඇති අවිනිශ්චිතභාවය නිසා අනාගත කාලසීමා සඳහා ඉදිරියට ගෙනයනු ලබන ශේෂයන්ගේ සුවිශේෂී ගැලපුම් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට ඉඩ ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියා වලියේදී මූල්‍ය ප්‍රකාශන වල සුවිශේෂී බලපෑමක් කරනු සමත් පහත දැක්වෙන තීරණ නිශ්චය කිරීම් සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කර ඇත.

අ) දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීව කාලය

වත්කමේ ඵලදායී ජීව කාලය , ක්ෂය කිරීමේ ක්‍රම වේදය හොදම ඇස්තමේන්තුව මත පදනම්ව කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අතර එම නිසාම ඒවා අවිනිශ්චිතතාවයෙන් යුක්ත වේ.

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල යම් වෙනස්කම් මූල්‍ය වාර්තා වලට අදාල සටහන් තුල හෙලිදරව් කර ඇත.

ආ)අඛණ්ඩ පැවැත්ම

ශ්‍රම වාසනා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අවිනිශ්චිතතාවයක් ඇති වන සැලකිය යුතු කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හදුනා ගෙන නොමැති නිසා අරමුදලේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනමක් මත වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති එම කාලය පුරාම ක්‍රියාත්මක වේ.

1.5 වත්කම් හා වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.5.1දේපල පිරියත හා උපකරණ (PPE)

අ) හදුනාගැනීම හා මිනුම්ගත කිරීම

දේපල පිරියත හා උපකරණ ඒවායේ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය සතු වන්නේ දැයි හෝ එහි පිරිවැය දේපල පිරියත හා උපකරණ පිළිබද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව විශ්වාසදායී ලෙස මැනිය හැකි දැයි යන්න මත ඒවායේ ධාරණ අගය විනිශ්චය කිරීම හා ක්ෂය කිරීම හා ඒවාට අදාල හානිකරණ අලාභ හදුනා ගනු ලැබේ.

මුලික අදියරේ දී දේපල පිරියත හා උපකරණ එහි පිරිවැයට තක්සේරු කරනු ලබයි.

ආ)පිරිවැය

දේපල පිරියත හා උපකරණ වල පිරිවැය එහි මිලදී ගැණුම් පිරිවැය සහ එහි අදහස් කරන භාවිතය සහ කාර්යය මට්ටමට සෘජුවම දායක විය හැකි යම් පිරිවැය ඇතුලත් වේ.

දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල පසු ලැබෙන පිරිවැයට දක්වනු ලැබේ.

ත්‍යාග වශයෙන් අරමුදලට ලද ලද වත්කම් සමුච්චිත අරමුදලට බැර කර දේපල පිරියත හා උපකරණ ගිණුමට හර කර ඇත.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

ඇ). පසුකාලීන වියදම්

වත්කම් වල ඉපැයීමේ ධාරිතාව පවත්වා ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම,ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා දැරූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

ඈ). ක්‍ෂය වීම්

ඉඩම් හැර සෙසු වත්කම් ක්‍ෂය කිරීමේදී දේපල පිරියත හා උපකරණ අයිතම වල එක් එක් කොටස්වල ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්‍ෂය කරනු ලැබේ.වත්කම් භාවිතයට ගන්නා අවස්ථාවේ සිට එය ඉවත් කරන දිනය දක්වාම ක්‍ෂය කිරීම සිදු කරනු ලැබේ.

පහත ක්‍ෂය අනුපාත යටතේ ක්‍ෂය කරනු ලැබේ.

වාහන	10%
යන්ත්‍රෝපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	25%
පරිඝණක	25%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	07.5%
මෘදු කාංග	20%

ඉ). අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් යනු මූල්‍ය වටිනාකමක් සහිත භෞතික නොවන වත්කම් වේ.

ඊ). හඳුනාගැනීමේ පදනම

වත්කමක පිරිවැයට වඩා විශ්වාසවන්තව මැනිය හැකි මෙන්ම එම වත්කම අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුලට ගලා එන්නා වූ භෞතික පැවැත්මක් නොමැති වත්කම් මේ යටතේ හඳුනා ගැනේ.

- ගිණුම්කරණ මෘදුකාංග

ආයතනය විසින් මිලදී ගන්නා ලද ගිණුම්කරණ මෘදුකාංග අත්පත් කර ගැනීමේ පිරිවැය මත මිනුම් කිරීම සිදු කරන අතර,පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්‍ෂය කපා හැරීම සිදු කරයි.

උ)අස්පෘශ්‍ය වත්කම් ක්‍ෂය

වත්කම භාවිතයට ගත් දිනයේ සිට වත්කම් ඵලදායී ජීවිත කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්‍රම ක්‍ෂය කිරීමෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම සිදු කරයි.

ඌ). වත්කම් ප්‍රත්‍යාගණනය.

ප්‍රත්‍යාගණනය රජයේ පිළිගත් ඒ පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලත් පුද්ගලයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් වාහන හැර අනෙකුත් සියලුම දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය (SLAPS 07) සිදු කර ඇත.

අරමුදලට පවරා දුන් KO 7519 කාර් රථය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර ඇත. සියලු නව ප්‍රත්‍යාගණන වටිනාකම් ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

එ). ඉවත් කිරීම

දේපල පිරියත හා උපකරණ පවත්නා වටිනාකම ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී ඉවත් කිරීම සඳහා හඳුනා ගැනේ. ප්‍රාග්ධන අයිතම බැහැර කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLAPS 07)අනුකූලව ගිණුම් ගත කර ඇත.

1.5.2 තොගය

තොගය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රකාශ කෙරේ. තොගය බර තැබූ සාමාන්‍ය පිරිවැය මත නිකුත් කිරීම සිදු කර ඇත.

1.5.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් එක්රැස් කරගත නොහැකි සියලුම වටිනාකම් සඳහා වන සියලුම බිල්පත් වල වටිනාකම වේ. ලැබිය යුතුගිණුම් ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සහ ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොළිය වේ.

අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදලට ලැබිය යුතු ප්‍රධාන ආදායම් ප්‍රභවය ජාතික සම්පත ලොතරැයි අලෙවිය මගින් ලැබෙන අලෙවි ආදායමෙන් 10% දායකත්ව දැක්විය හැක. සෑම මසකම එසේ ලැබෙන ලොතරැයි ආදායම ලොතරැයි මණ්ඩලය මගින් ඒකාබද්ධ අරමුදලට බැර කෙරෙන අතර අරමුදලේ වාර්ෂික අවශ්‍යතාවට අනුව කාර්තු වශයෙන් මුදල් නිකුත් කෙරේ. ඒකාබද්ධ අරමුදල තුල ශ්‍රම වාසනා අරමුදල නමින් අරමුදලට ලැබිය යුතුව ඇති මුදල මෙමගින් නිරූපනය වේ.

ආ) ස්ථාවර තැන්පතු ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදල නමින් රාජ්‍ය බැංකු හතරක පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු මගින් වර්ෂයට අදාලව ලැබිය යුතු තිබුව තිබු නමුත් මෙතෙක් නොලැබු මුදල් වේ.

15.4 ආයෝජන

ආයෝජන වසරකට වඩා අඩු කාලයක් සඳහා වූ කෙටිකාලීන ආයෝජන සහ වසරකට වඩා වැඩි කාලයක් සඳහා වූ දිගුකාලීන ආයෝජන වලින් යුක්ත වේ. මාස තුන මාස හය සහ අවුරුද්දක කාලයක් සඳහා ස්ථාවර තැන්පතු වල සිදු කරන ලද කෙටිකාලීන ආයෝජනයන්ද ශ්‍රම වාසනා අරමුදලේ වෙබ් අඩවිය සහ පරිසණක ගත තොරතුරු පද්ධතිය සහ ප්‍රමිත සහතිකය ලබා ගැනීම තෙක් සිදු කරන ලද දිගුකාලීන ආයෝජනයන් ද නිරූපනය වේ.

1.5.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

1.6 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂ පත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කල නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කොට ඇත. මූල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැදීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ.මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

1.6.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් හා ප්‍රතිපාදන

අ) පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

1983 අංක 12 හි පාරිතෝෂික පනත ට අනුව ශ්‍රම වාසනා අරමුදල පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී.ඒ සඳහා ගණනය කරන ලද වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුල නිරූපනය කෙරේ.

ආ) දායක සැලසුම් අර්ථ දැක්වීම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ.

සේවකයාගේ මුලු වේතනයෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා 3% ක් අරමුදල විසින් දායක කරනු ලැබේ.

ඇ) නීති ආඥාර ලබා දීම් සඳහා වෙන් කිරීම

ශ්‍රම වාසනා අරමුදලේ එක් අරමුණක් වන නීති ආධාර ලබා දීමේදී නඩුව විභාග වන අතර තුර පළමු නීති ආධාර වාරික මුදල් ලබා දෙන අතර දෙවන වාරික මුදල් නඩු වේ නියෝගය ලැබුණු පසු ලබා දීම සිදුවේ. වර්ෂය තුලදී අවසන් නියෝගය නොලද නඩු සඳහා මෙම වෙන් කිරීම් සිදු කර ඇත.

1.7.1 ආදායම/අයභාරය

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ලැබීම් ස්වභාවයේ හෝ ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වැඩි වීමේ ප්‍රතිඵලයක් සේ ලැබෙන ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන්හි දළ ගලා යාමකි. ආදායම හා පොළී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන අතර ආදායමෙහි ඖතික සම්පත ලොතරැයි ආදායම,ස්ථාවර තැන්පතු පොළී ආදායම ප්‍රධාන වේ.

1.7.2 වියදම

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ගලායෑම් ස්වාභාවයෙන් හෝ වත්කම් පරිභෝජන ස්වාභාවයෙන් හෝ බැරකම් ඇතිවීමේ ස්වාභාවයෙන් සිදුවන ආර්ථික ප්‍රතිලාභයන්ගේ හෝ සේවා ශක්‍යතාවයන්ගේ අඩු වීමකි. ශ්‍රම වාසනා අරමුදලේ කටයුතු පවත්වා ගෙන යාම ,අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන ප්‍රාග්ධන සහ අයභාර ස්වභාවයේ සියලුම දෑ වේ.

1.8. ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන වැදගත් ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සහ අනාවරණයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

1.9. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අනුකූලව ‘‘වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහය සකස් කර ඇත.

ගිණුම් වලට අදාල සටහන්

(සියලු අගයන් රුපියල් වලින් දක්වා ඇත)

සටහන 01

01-1 පිරියත යන්ත්‍ර හා උපකරණ	**2021 01-01ශේෂය**	එකතු කිරීම්	විකිණීම්/ලියාහැරීම් ගැලපීම්	**2021-12-31** ශේෂය
වාහණ	12,882,500.00	-	-	12,882,500.00
යන්ත්‍ර හා උපකරණ	99,050.00	228,042.00	-	327,092.00
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	222,100.00	12,800.00	(2,000.00)	232,900.00
ශීතකරණ	180,000.00	-	-	180,000.00
පරිඝණක	3,006,524.30	680,925.00	(6,667.00)	3,680,782.30
ලීබඩු හා සවිකිරීම්	752,096.60	132,107.00	(7,700.00)	876,503.60
කාර්යාලීය උපකරණ	181,397.50	141,731.00	(12.50)	323,116.00
	17,323,668.40	**1,195,605.00**	**(16,379.50)**	**18,502,893.90**

01-2 ක්ෂයවීම

	2021 01-01 ශේෂය	වසරට අදාල අයකිරීම	විකිණීම්/ලියාහැරීම් ගැලපීම්	**2021-12-31** ශේෂය
වාහණ	4,136,290.14	1,288,250.00	-	5,424,540.14
යන්ත්‍ර හා උපකරණ	23,608.09	50,800.47	-	74,408.56
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	64,422.47	55,388.97	(852.33)	118,959.11
ශීතකරණ	42,904.11	36,000.00	-	78,904.11
පරිඝණක	648,651.76	900,733.64	(2,876.86)	1,546,508.54
ලීබඩු හා සවිකිරීම්	79,461.27	85,116.72	(2,554.09)	162,023.90
කාර්යාලීය උපකරණ	15,513.03	28,944.59	(11.79)	44,445.83
	5,010,850.87	**2,445,234.39**	**(6,295.07)**	**7,449,790.19**

සටහන 02

අස්පෘශ්‍ය වත්කම්- මෘදුකාංග

	2021-01-01 දිනට පිරිවැය	මාරු කිරීම්	විකිණීම්/ලියාහැරීම් ගැලපීම්	**2021-12-31** ශේෂය
ගිණුම්කරණ පැකේජය	30,000.00	-	-	30,000.00
අන්තර්ජාලය, ISO, සහතිකය				-
අන්තර්ජාල මුලික පද්ධතිය	-	2,774,958.00	-	2,774,958.00
	30,000.00	**2,774,958.00**	**-**	**2,804,958.00**

ක්‍රමක්ක්ෂය කිරීම

අස්පෘශ්‍ය වත්කම්- මෘදුකාංග	**2021-01-01** දිනට පිරිවැය	මාරු කිරීම්	විකිණීම්/ලියාහරීම් ගැලපීම්	**2021-12-31** ශේෂය
ගිණුම්කරණ පැකේජය	7,149.77	6,000.00	-	13,149.77
අන්තර්ජාල මුලික පද්ධතිය	-	554,991.60	-	554,991.60
	7,149.77	**560,991.60**	**-**	**568,141.37**

සටහන 03

මුදල් සහ මුදල් හා සාන අයිතම	
මහජන බැංකුව 119100103693128	667,882.85
මහජන බැංකුව විද්‍යුත් කාඩ් 11910293693128	10,000.00
	677,882.85

සටහන 04 **වෙනත් ලැබියයුතු අයිතම**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	346,643,444.18
ආපදා ණය	1,527,600.00
ස්ථාවර තැන්පතු ආයෝජන පොලි	3,365,582.19
ආපසු ලැබිය යුතු තැන්පතු	3,000.00
ලොතරැයි මණ්ඩලයෙන් ලබියතු	100,000.00
	351,639,626.37

සටහන 05 **තොගයන්**

ලිපිද්‍රව්‍ය තොගය	542,607.40
වැඩසටහන්වලට අදාල තොගය	44,047.86
	586,655.26

(තොගය සාමාන්‍ය බර තැබූ ක්‍රමයට ගණනය කර ඇත).

සටහන 06

2021- 01-01 දිනට සමුච්චිත අරමුදල	461,567,133.10
2021 වසර සඳහා අතිරික්තය	2,140,835.12
2021- 12-31 දිනට සමුච්චිත අරමුදල	**463,707,968.22**

සටහන 07 **වෙනත් ගෙවියයුතු අයිතම**

දුරකථන බිල්	29,335.70
අතිකාල දීමනා	14,019.60
වෙනත්	30,499.80
	73,855.10

සටහන 08 **වෙන්කිරීම්**

නීති ආධාර	772,000.00
නීති ආධාර - අභියාචනා	140,000.00
නීති ආධාර - බෙරුම්කරණය	10,000.00
විගණන ගාස්තු	325,000.00
	1,247,000.00

සටහන 09 **ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් අනුපාතයන් යටතේ ක්ෂය කරන ලදී**

වාහණ	10%
යන්ත්‍ර හා උපකරණ	20%
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	25%
ශීතකරණ	20%
පරිසණක	25%
ලීබඩු හා සවිකිරීම්	10%

කාර්යාලීය උපකරණ	7.5%
මෘදුකාංග	20%

(වත්කමේ අවසාන අගය රුපියල් 1 ක් වනසේ සලකා වත්කම් ක්ෂය කරනු ලබයි).

සටහන 10 **ආදායම්**

ලොතරැයි ආදායම	27,502,924.00
ස්ථාවර තැන්පතු ආදායම	6,311,136.97
ආපදා ණය පොලි	68,932.57
කෙටිකාලීන තැන්පතු (REPO) පොලි	295,650.37
ක්ෂණික තැන්පත් (Call deposit) පොලි	22,006.85
රාජ්‍ය ප්‍රදාන	362,500.00
වෙනත් ආදායම්	109,165.57
	34,672,316.33

සටහන 11 **පරිපාලන වියදම්**

වැටුප් හා වේතන	6,692,226.20
සේ.අ.අ.	1,779,687.00
සේ.භා.අ.	266,953.05
ජීවනාදර දීමනා	1,497,600.00
වෙනත් දීමනා	258,960.00
සභාපති දීමනා	186,875.00
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	347,500.00
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා	15,000.00
අභ්‍යන්තර විගණක දීමනා	21,750.00
වෘත්තීය දීමනා	180,000.00
ප්‍රසාධ දීමනා	240,000.00
සේවක පාරිතෝෂික	569,695.00
අතිකාල හා නිවාඩු දින දීමනා	76,676.63
ගමන් වියදම්	87,130.80
ප්‍රවාහන දීමනා	123,060.32
ලිපිද්‍රව්‍ය හා වෙනත්	399,419.17
තැපැල් වියදම්	5,434.70
දුරකථන	307,016.20
සංග්‍රහ වියදම්	49,612.30
කෙටි ආහාර	57,266.35
නොයෙක් වියදම්	66,358.56
විවිධ වියදම්	33,586.00
විගණන වියදම්	140,000.00
ජලය හා විදුලිය	25,689.91
වෙනත් සේවා	451,468.86
අලුත් වැඩියා හා නඩත්තු	512,771.44
වාහන රක්ෂණ	112,245.48
සේවක සුබසාදනය	192,000.00
සේවක පුහුණුව	95,300.00
	14,791,282.97

සටහන 12 **ක්ෂයවීම්**

වාහන	1,288,250.00
පරිසනක	900,733.64
වායුසමීකරණ	36,000.00
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	55,388.97
ලීබඩු හා උපකරණ	85,116.72
කාර්යාලීය උපකරණ	28,944.59
යන්ත්‍රෝපකරණ	50,800.47
ක්‍රමක්ෂය	560,991.60
	3,006,225.99

සටහන 13 **අරමුණු ලභා කර ගැනීම වෙනුවෙන් වූ වියදම්**

දැනුවත් කිරීමේ වැඩසටහන්	280,236.50
සුබසාධක වැඩසටහන්	46,419.04
සනීපාරක්ෂක ව්‍යාපෘතිය	6,184,206.16
කෘත්‍රිම අත් පා ලබා දීම	50,000.00
නීති ආධාර වැඩසටහන	468,015.00
නීති සහනාධාර - අභියාචනා	300,000.00
මූල්‍ය සහන - බේරුම්කරණය	30,000.00
නීති ආධාර - පාසල් උපකරණ ලබාදීම	38,454.49
ශිෂ්‍යත්ව වැඩසටහන	3,634,417.61
තාක්ෂණික පුහුණු වැඩසටහන	8,320.00
සානුකම්පිත දීමනා	10,725.00
වෛද්‍යාධාර ලබාදීම	200,000.00
ත්‍යාග ප්‍රධානෝත්සවය	3,194,281.60
	14,445,075.40

සටහන 14 **වෙනත් වියදම්**

ලොතරැයි පිළිබඳ මහජන දැනුවත් කිරීම්	91,498.51
ඵලදායිතා වැඩසටහන	197,398.34
	288,896.85

සටහන 15 **පෙර වසරේ ගැලපීම්**

ස්ථාවර තැන්පතු පොලි	**(125,265.68)**

15.1 **ස්ථාවර තැන්පතු පොලි ගණනයේදී වැඩිපුර ගණනය වූ මුදල් ගලපා ඇත.**

සටහන 16 නාරාහේන්පිට මහජන බැංකු ශාඛාවේ "සභාපති ශ්‍රම වසනා අරමුදල" ලෙස ජංගම ගිණුම් 2 ක් පවත්වාගෙන යනු ලබයි.
අංක 119100103693128 දරන ගිණුම දෛනික ගනුදෙනු වෙනුවෙන් ද,
අංක 119100293693128 දරන ගිණුම හරපත් ගිණුමක් ලෙසද වේ

සටහන 17 ශ්‍රම වසනා අරමුදලේ සේවය කළ සේවකයින් දෙදෙනෙකු විසින් කොළඹ මහාධිකරණයේ අංක HCALT/74/202 හා HCALT/75/220 ලෙසින් නඩු දෙකක් ගොනුකර ඇත.

සටහන 18 web Based system ලෙස ආයෝජන වල දක්වා තිබූ වත්කම, වත්කම් ගිණුමට මාරුකර ක්‍රමක්ක්ෂය කරනු ලබයි.

සටහන 19 ස්ථාවර තැන්පතු වලින් රුපියල් මිලියන 9 ක ප්‍රමාණය නිදහස් කර පරිපාලන හා අරමුණු වලට අදාළ වියදම් වෙනුවෙන් යොදා ගන්නා ලදී.

සටහන 20 රාජ්‍ය ප්‍රධාන ලෙස ලද වත්කම් 10% බැගින් වාර්ෂිකව ක්‍රමක්ක්ෂය කරනු ලබයි.

සටහන 21 සාමූහික තොරතුරු
මෙම වසරේ තොරතුරු තහවුරු කිරීම සඳහා අවශ්‍ය පෙර වසරේ තොරතුරු නැවත සකස්කර ඇත.

සටහන 22 ශ්‍රම වසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය අරමුදල සමග සෘජු හෝ වක්‍ර ආකාරයෙන් කොන්ත්‍රාත් වලට සම්බන්ද නොවේ.

සටහන 23 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
මූල්‍ය වාර්තා සකස්කිරීම හා ඉදිරිපත් කිරීම පිලිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/SVF/SR/01/2021 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 ජූනි 22 දින

යහාපනි.

ශ්‍රම වාසනා අරමුදල.

ශ්‍රම වාසනා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටේක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න.
විගණකාධිපති.

පිටපත : ලේකම්. මුදල්. ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/SVF/SR/01/2021 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2022 ජූනි 22 දින

සභාපති
ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රම වාසනා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික් විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත	
(i) 3 : 3 උප වගන්තිය	පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සැදීමට බලය ලබා දී

තිබුණත් 2021 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති පිළියෙල කර නොතිබුණි.

(ii) 3 : 4 : (2 ඇ) උප වගන්තිය — කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බෙරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තකයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තක්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, අදාල රීති 2021 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි.

(iii) 13 : 1 උප වගන්තිය — අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් හා යම් ලොතරැයි වර්ග අරමුදල වෙනුවෙන් එක් එක් වර්ෂයේදී පවත්වනු ලැබිය යුතු වුවද, අරමුදල විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයකට එළඹ නොතිබුණි.

(iv) 13 : (2අ) උප වගන්තිය — අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇති කර ගන්නා එකඟවීමට වෙනත් කරුණු අතර, එසේ පවත්වන ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව, ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව, සහ ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල් යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව විධිවිධාන ඇතුලත් විය යුතු වුවත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයන්ට එළඹ නොතිබුණි.

(v) 14 : 1 උප වගන්තිය — මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති හෝ මේ පනත මගින් රීති සැදීමේදී බලය දී ඇති හෝ රීති සැදීම අවශ්‍ය යැයි සලකන කාරණා සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි වුවද 2021 දෙසැම්බර් 31

	දින වන විටත් එබඳු රීති පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.
(vi) පනතේ 4(1) (අ) වගන්තිය සහ 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතේ 2 (1) (අ) වගන්තිය	මණ්ඩලයේ සභාපතිවරයා විය යුත්තේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාය. 2020 අගෝස්තු 09 වන දින අංක 2187/27 දරණ ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය අනුව සියලුම අරමුදල් මුදල් අමාත්‍යාංශය යටතට පත් කර ඇති බැවින් අරමුදලේ සභාපතිවරයා විය යුත්තේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාය. එසේ වුවද,භාණ්ඩාගාර ලේකම්වරයාගේ MF1/05/01/178 – SVF/02 අංකය දරණ 2021 ජුනි 02 දිනැති ලිපිය මගින් සභාපතිධූරය සඳහා කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් එකඟතාවය ලබාදුන් බව දන්වමින් කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කිරීමට කටයුතු කොට තිබුණි.
(vii) පනතේ 6(අ) හා 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල සංශෝධන පනතේ 3 (1) වගන්තිය	සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කල යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනටත් සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.
(viii) 6 (ආ) වගන්තිය	සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථාවක, ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම කලයුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට එබඳු මූල්‍ය හා වෙනත් අධාර සපයා නොතිබුණි.
(ix) සංශෝධිත පනතේ 3 (3) උ (ii) වගන්තිය	මූල්‍යමය සහන සඳහා තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයට යටත් විය යුතු බව සඳහන් වුවත් 2021 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති සටහන් කර නොතිබුණි.
(x) සංශෝධිත පනතේ 6 (3) 1 වගන්තිය	ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති සම්බන්ධයෙන් සඳහන් වුවත් 2021 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති ගැසට් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ අරමුදලින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.27,502,924 කින් රු.13,000,000 ක් පමණක් ලැබී තිබුණු අතර රු.14,502,924 ක් ලැබිය යුතුව තිබුණි. තවද එම ශේෂය ද ඇතුළත් ලැබිය යුතු ශේෂය රු.346,643,444 ක් 2004 වසරේ සිට ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතුව පවතින අතර එම ශේෂය ඒකාබද්ධ අරමුදලින් අයකර ගැනීමට නිසි පියවරයන් අනුගමනය කර නොතිබුණි. භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි මුදල් ලබාගැනීමට නොහැකි වීම අරමුදලේ අරමුණු ඉටුකරගැනීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කර තිබුණි.

(ආ) බදුල්ල දිස්ත්‍රික්කයේ වතු කම්කරු ජනතාව (Estate Labour Workers) සඳහා සනීපාරක්ෂක වැසිකිලි 200 ක් ශ්‍රම වාසනා අරමුදලින් ඉදිකිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඇති අරමුදල සතු මුදලින් රු.10,000,000 ක මුදලක් 2021 පෙබරවාරි මාසයේදී ලබාදී තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුල රු.5,950,000 ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රතිලාභීන් වෙත ගෙවීම හා ව්‍යාපෘතියේ අනෙකුත් වියදම් ලෙස රු.234,206 ක් වැයකර තිබුණි. 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ සහ 2019 අංක 15 දරණ සංශෝධිත පනතේ අරමුණු අනුව සේවා නියුක්තිකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කලයුතු වුවද, එම අරමුණුවලට බාහිරව අඩුආදායම් ලාභීන් 140 දෙනෙකු වෙත මෙම වැසිකිලි ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ සලසා දී තිබුණු අතර එය මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාවෙන් සියයට 70 ක් විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රම වාසනා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්දයෙන් ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය.

1.

1.2.1.මුදල් ප්‍රවාහ ප්‍රකාශ.

(අ) පාරිතෝෂික සඳහා වර්ෂය තුළ වූ වෙන් කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී කාරක ප්‍රාග්ධන සංචලනය තුළින් ඉවත් කොට මෙහෙයුම් ලාභයෙන් ගැළපීමට ඉදිරි මූල්‍ය ප්‍රකාශ තුළ කටයුතු කරනු ඇත.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඡේදය 27(ආ) අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යටතේ වර්ෂයේ අතිරික්තයෙන් ආරම්භ කර ආපදා ණය ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස රු.36,734.00 ක මුදල කාරක ප්‍රාග්ධන සංචලන වල වෙනස් වීම් යටතේ ගලපා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඡේදය 27(අ) අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේ සෘජු ක්‍රමය යටතේ ඉදිරිපත් කළ විට මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දැක්වීම සිදු වේ. ශ්‍රම වාසනා අරමුදල වක්‍ර ක්‍රමය භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඇති හෙයින් කාරක ප්‍රාග්ධන සංචලන යටතේ ගලපා ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.2.2.(අ)

(i,ii)

2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව රීති සකස් කිරීමට අදාල වූ 6(3) වගන්තිය සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ 14 වන වගන්තියට අනුව රීති සකස් කිරීම වෙනුවෙන් වූ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ රීති සකස් කිරීමට අදාල 3(3) වගන්තිය සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ රීති සකස් කිරීමට අදාලවූ 3(3)g(ii) වගන්තියෙහි සඳහන් කරුණුද එක්කර මේ වන විට අදාල රීති ගැසට් පත්‍රයේ පළ කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මේ වන විට මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත.

(iii,iv)

2017 වර්ෂයේ සිට ලොතරැයි මණ්ඩලය සමඟ ඇති කර ගත යුතු එකඟතාවයේ කෙටුම්පතක් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර 2017 වර්ෂය සිට මේ දක්වා වාර්ෂිකව මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය දැනුවත් කළ ද ඒ සම්බන්ධයෙන් එකඟතාවක් පළ වී නොමැත.කෙසේ වුවද, මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ඉදිරියේදී අවස්ථාවක් ලබා දෙන බව

වාචිකව ප්‍රකාශ කර ඇත.කිහිප අවස්ථාවකම සිහි කැඳවීම් කළද ඊට ප්‍රතිචාරයක් මේ දක්වා ලබා දී නොමැත.

(v)

මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශය වෙත ගැසට් කිරීම ඉක්මනින් සිදු කර ගැනීම පිළිබඳ 2021.12.30 දිනැති සිහි කැඳවීම් ලිපිය යොමු කර ඇත

(vi)

කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා දිගුකාලයක් පාසල් වසා දමා ඇති අවස්ථාවක පාසල් උපකරණ ලබා දීම ප්‍රායෝගිකව ඵලදායී නොවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් උපදෙස් පරිදි වැඩසටහන සිදු නොකිරීමට තීරණය විය.

(vii)

සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථා වලදී ඒ පිළිබඳ තොරතුරු සේවය අවසන් කිරීමේ අංශය මඟින් අදාළ ප්‍රතිලාභීන් වෙත ශ්‍රම වාසනා අරමුදල මඟින් විස්තර හා අයදුම්පත් ලිපි යවා ඔවුන් වෙත දුරකථනය ඔස්සේද දැනුවත් කිරීම සිදු කළ නමුත් ඒ සඳහා ඔවුන්ගෙන් පිළිතුරක් නොලැබී ඇති බව ප්‍රකාශ කරමි.

(viii)

සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම යටතේ වාර්ෂික ඉලක්ක ප්‍රමාණය 25 වන අතර ඉන් 2021 දෙසැම්බර් 31 දිනට ඉලක්ක 23ක් සපුරා ඇත.

(ix)

2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව රීති සකස් කිරීමට අදාල වූ 6(3) වගන්තිය සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ 14 වන වගන්තියට අනුව රීති සකස් කිරීම වෙනුවෙන් වූ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ රීති සකස් කිරීමට අදාල 3(3) වගන්තිය සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ රීති සකස් කිරීමට අදාලවූ 3(3)g(ii) වගන්තියෙහි සඳහන් කරුණුද එක්කර මේ වන විට අදාල රීති ගැසට් පත්‍රයේ පළ කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.මේ වන විට මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත.නීති කෙටුම්පත් සම්පාදක මඟින් මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(x)

සංශෝධන පනතේ 6(3)(1) වගන්තිය ප්‍රකාරව ගැසට් කිරීමට අවශ්‍ය රීති සැකසීම පිළිබඳව 2021.12.30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ගැසට් පත්‍රය පළ කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇත.තවද මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

2.3.වෙනත් කරුණු

(අ) KO 7519 කාර් රථයේ ඉන්ධන පරීක්ෂාව 2019.07.18 දින සහ NC 8143 වෑන් රථයේ ඉන්ධන පරීක්ෂාව 2017.09.28 දින සිදු කර ඇත.2020 මාර්තු මාසයේ සිට රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීම හා රාජකාරී අවශ්‍යතාවය මත සේවයේ යෙදවීම හේතුවෙන් නියමිත කාලයේදී ඉන්ධන පරීක්ෂාව සිදු කර ගැනීමට නොහැකි විය.

තවද 2020.08.09 වන දින සිට ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යාංශය යටතට ගැනීමත් සමඟම ඉන්ධන පරීක්ෂාව සඳහා නිලධාරියෙකු පත් කර එවන මෙන් අදාළ අමාත්‍යාංශය වෙත දන්වා යවා සිටි නමුත් ඒ සඳහා නිලධාරීන් පත් කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව සිදු කර ගැනීමට නොහැකි විය. ඉදිරියේදී මෙය නිසි පරිදි සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ආ) ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන ආදායම ලොතරැයි මණ්ඩලය විසින් ශ්‍රම වාසනා අරමුදල නමින් වූ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි.සෑම වර්ෂයක් සඳහාම පිළියෙල කරනු ලබන අයවැය ලේඛණය සහ ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි සඳහන් ප්‍රතිපාදන සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයට ලිපි යොමු කිරීම මඟින් ඉල්ලුම් කරයි.

2004 වර්ෂයේ සිට ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන මුදල් 2008 වර්ෂය දක්වා චෙක්පත් මඟින් ශ්‍රම වාසනා අරමුදලට කොටස් වශයෙන් ලැබීමට සලස්වා ඇති නමුත් 2009 වසරේ සිට 2014 වසර දක්වා එම මුදල් අරමුදලට ස්ථාවර තැන්පතු ප්‍රමාණය සළකා බලා ලබා දීම නතර කර තිබුණි.2015 සිට මේ දක්වා ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති මුදල් විටින් විට ශ්‍රම වාසනා අරමුදල වෙත භාණ්ඩාගාරය මඟින් ලබා දෙන ලදී.

2022.04.22 දිනැති TOD/REV/MIS/02/07(i) දරණ ලිපිය මඟින් ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ සැලකිය යුතු ප්‍රමාණයක ස්ථාවර තැන්පතු පවත්වා ගෙන යන බව නිරීක්ෂණය වී ඇති බවත් ඉල්ලුම් කරන පරිදි අරමුදල් නිදහස් කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ස්ථාවර තැන්පතු මත, අරමුදල උපයන පොළී ආදායමට වැඩි පිරිවැයක් දැරිය යුතු බැවින්,ආයතනයේ මූල්‍යමය කටයුතු කළමණාකරණය කර ගැනීම සඳහා මේ වන විට ශ්‍රම වාසනා අරමුදල සතුව ඇති ස්ථිර තැන්පතුවල මුදල් අවශ්‍ය කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් අප වෙත එවා ඇත.

2.3

(ඇ) 2020 අගෝස්තු 09 වන දින අංක 2187/27 දරණ ජනාධිපති කාර්යාලය මඟින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ මුදල් අමාත්‍යාංශය යටතට අයත් ආයතන හා ක්‍රියාත්මක විය යුතු අණ පනත් යටතේද ශ්‍රම වාසනා අරමුදල ඇතුළත් කර ඇත.එසේම එම ගැසට් පත්‍රයේම කම්කරු අමාත්‍යාංශය යටතේ ද ක්‍රියාත්මක විය යුතු අණ පනත් යටතට පමණක් ශ්‍රම වාසනා අරමුදල් පනත ඇතුළත් කර ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ සභාපති ලෙස සිටි ජූඩ් නිලුක්ෂන් මහතා ඉල්ලා අස්වීම මත MF1/05/01/178-SVF-02 හා 2021 ජූනි 02 වන දින ශ්‍රම වාසනා අරමුදලේ සභාපති ලෙස කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කළ ලිපිය කම්කරු අමාත්‍යාංශය මඟින් 2021.06.22 ශ්‍රම වාසනා අරමුදල වෙත ලැබී ඇත.මේ පිළිබඳව පැහැදිළි කිරීමක් කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් කරුණු පැහැදිළි කර ගන්නා ලෙස මීට ඉහතදී විගණකාධිපති වෙත ඉල්ලීමක් කර ඇත.

එම්.පි.ඩි.යු.කේ.මාපා පතිරණ.
සභාපති ශ්‍රම වසනා අරමුදල

ඇමුණුම

දැනුවත් කිරීමේ වැඩසටහන්.

- ✓ කොවිඩ් වැනි ආපදා තත්වයන් හමුවේ තම රාජකාරි හා සේවාවන් පවත්වාගෙන යාම පිලිබඳ ආකල්ප සංවර්ධන වැඩසටහන. 2021 පෙබරවාරි 16 කොග්ගල අපනයන සැකසුම් කලාපය.
- ✓ සමාජ කටීකාව හා වැඩපළ සහයෝගිතාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 මාර්තු 23 රත්නපුරය.
- ✓ ඵලදායීතාවය හා ආකල්ප සංවර්ධනය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 මාර්තු 31 CBL ආයතනය කොට්ටාව
- ✓ වෘත්තීය ආරක්ෂණය හා සෞඛය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 ඔක්තෝම්බර් 26 හොරණ අපනයන සැකසුම් කලාපය.
- ✓ වෘත්තීය ආරක්ෂණය හා සෞඛය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 නොවැම්බර් 02 අවිස්සාවේල්ල අපනයන සැකසුම් කලාපය.
- ✓ වෘත්තීය ආරක්ෂණය හා සෞඛය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 නොවැම්බර් 09 කටුනායක අපනයන සැකසුම් කලාපය.
- ✓ වෘත්තීය ආරක්ෂණය හා සෞඛය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 නොවැම්බර් 26 පල්ලෙකැලේ අපනයන සැකසුම් කලාපය.
- ✓ සමාජ කටීකාව හා වැඩපළ සහයෝගිතාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 දෙසැම්බර් 01 හා 03 නුවරඑලිය.

සුබසාදක වැඩසටහන්

- ✓ අඩු ආදයම්ලාභී කම්කරු පවුල් වල අධ්‍යාපනය ලබන දු දරුවන් වෙත පාසල් උපකරණ ලබාදීම 2021 මාර්තු 27 දඹුල්ල කම්කරු කාර්යාලය.
- ✓ සනීපාරක්ෂක පහසුකම් නොමැති බදුල්ල දිස්ත්‍රික්කයේ කම්කරු පවුල් හා ඔවුන්ගේ යැපෙන්නන් ගේ පවුල් වෙනුවෙන් වැසිකිලි 200 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන.

- ✓ දු දරුවන් 50 දෙනෙකු වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රධානය 2021 ජනවාරි 26 කම්කරු දෙපාර්තමේන්තුව - නාරාහේන්පිට
- ✓ දු දරුවන් 05 දෙනෙකු වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රධානය 2021 මාර්තු 27 දිස්ත්‍රික් කම්කරු කාර්‍යාලය දඹුල්ල.
- ✓ දු දරුවන් 35 දෙනෙකු වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රධානය 2021 දෙසැම්බර් 12 දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය අනුරාධපුරය.



ශ්‍රම වාසනා අරමුදල,
අංක 97,
ජාවත්ත පාර,
කොළඹ 05

දුක අං 011 2 588 936

ෆැක්ස් 011 2 588 937